# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2137/86 - 2019 අගෝස්තු මස 23 වැනි සිකුරාදා - 2019.08.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1973 අංක 25 දරන ක්‍රීඩා පනත

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමග කියවිය යුතු 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

හරීන් ප්‍රනාන්දු, (පා.ම)
විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍ය.

2019 ජූලි මස 31 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

ජාතික ක්‍රීඩා සංගම් සම්බන්ධයෙන් වන 2016.10.27 දිනැති හා අංක 1990/23 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ*, පළකරන ලද 2016 අංක 01 දරන නියෝග, 2017.02.13 දිනැති අංක 2006/13 දරන නියෝග, 2017.05.05 දිනැති අංක 2017/41 දරන නියෝග, 2018.09.22 දිනැති අංක 2089/56 දරන නියෝග, 2018.10.18 දිනැති අංක 2093/39 දරන නියෝග සහ 2019.01.10 දිනැති අංක 2105/38 දරන නියෝග පහත පරිදි නැවත සංශෝධනය වේ.

1. 2018.09.22 දිනැති අංක 2089/56 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 8(2) නියෝගය ඉවත් කිරීම මගින් හා පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්

   '8(2) ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයා විසින් ලියාපදිංචි කරනු ලැබූ ජාතික ක්‍රීඩා සංගමයක් විසින් දෙනු ලැබූ තීරණයක් හෝ ගනු ලැබූ ක්‍රියාමාර්ගයක් හෝ ජාතික ක්‍රීඩා සංගම් නිලවරණ කමිටුව විසින් දෙනු ලැබූ තීරණයක් සම්බන්ධයෙන් වූ අභියාචනාවක් සලකා බැලීමෙන් අනතුරුව ශ්‍රේෂ්ඨාධිකරණයේ විශ්‍රාමික විනිශ්චයකාරවරයන් හෝ අභියාචනාධිකරණයේ විශ්‍රාමික විනිශ්චයකාරවරයන් හෝ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ රජයේ නිලධාරීන්ගෙන් හෝ සමන්විත ත්‍රි පුද්ගල අභියාචනා උපදේශක කමිටුවක් වෙත එකී අභියාචනා ඉදිරිපත් කළයුතු අතර එවැනි අභියාචනාවක් සම්බන්ධයෙන් අභියාචනා උපදේශක කමිටුව තම තීරණය ; සමාලෝචනය පිණිස ලද එකී අභියාචනය යොමු කළ දින සිට සතියක් (දින 07ක්) ඇතුළත ලිඛිතව ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයාට දැන්විය යුතු ය.'

09 - 210

1A - PG 4624 — 517 (2019/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*